*සැ. යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රයෙහි දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වෙන වෙනම පළ වේ.*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1992/18 - 2016 නොවැම්බර් මස 08 වැනි අඟහරුවාදා - 2016.11.08**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත**

4 (2) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතේ අරමුණ සඳහා 2017 ජනවාරි 01 දිනයෙන් පසු බලාත්මක කරන ගිණුම්කරණ ප්‍රමිතවලට (SLFRSs) සංශෝධන (LKAS 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සංශෝධන සහ LKAS 12 ආදායම් බදුවලට සංශෝධන) මේ සමග පළකර ආයතනය විසින් සම්මත කර ඇත. මෙම සංශෝධන වර්ෂ දෙදහස් දහහතේ ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක කළ යුතුයි. කලින් ව්‍යවහාර කිරීමට අවසර ඇත.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2016 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දී ය.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - PG 3307 — (2016/11)

## 2017 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRSs) සංශෝධන (LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සංශෝධන සහ LKAS 12 - ආදායම් බදු වලට සංශෝධන)

1. හෙළිදරවු කිරීමේ මුලපිරීම - LKAS 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සංශෝධන
2. උපලබ්ධි නොවූ අලාභ සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගැනීම - LKAS 12 ආදායම් බදු වලට සංශෝධන

## හෙළිදරව් කිරීමේ මුලපිරීම - LKAS 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සංශෝධන

| |
|---|
| 44(අ) - 44(ඉ) ඡේද සහ සම්බන්ධිත මාතෘකා එකතු කර ඇත. 60 ඡේදයද අළුතින් එකතු කර ඇත. |

### මූල්‍ය ක්‍රියාකාරකම් වලින් පැන නගින වගකීම්වල වෙනස්කම්

**44අ අස්තිත්වයක් මුදල් ප්‍රවාහ වලින් පැන නගින වෙනස්වීම් සහ මුදල් නොවන වෙනස්වීම් යන දෙකම ඇතුළුව මූල්‍ය ක්‍රියාකාරකම් වලින් පැනනගින වගකීම්වල වෙනස්වීම් අගය කිරීමට මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට හැකියාව ලබා දෙන ආකාරයේ හෙළිදරව් කිරීම් සැපයිය යුතුය.**

44ආ 44අ ඡේදයේ අවශ්‍යතාවය සපුරාලීමට අවශ්‍ය ප්‍රමාණයට, මූල්‍ය ක්‍රියාකාරකම් වලින් පැන නගින වගකීම්වල පහත සඳහන් වෙනස්වීම් අස්තිත්වයක් හෙළිදරව් කළයුතුය.

(අ) මූල්‍ය මුදල් ප්‍රවාහවලින් වෙනස්වීම්;

(ආ) පරිපාලිත හෝ වෙනත් ව්‍යාපාරවල පාලනය ලබාගැනීම හෝ අහිමිවීම තුලින් පැන නගින වෙනස්වීම්;

(ඇ) විදේශ විනිමය අනුපාතිකයින්ගේ වෙනස්වීම්වල බලපෑම;

(ඈ) සාධාරණ අගයන්වල වෙනස්වීම්; සහ

(ඉ) වෙනත් වෙනස්වීම්.

44ඇ මුදල් ප්‍රවාහ හෝ අනාගත මුදල් ප්‍රවාහ ලෙස වගකීම්, මූල්‍ය ක්‍රියාකාරකම් වලින් පැන නගින වගකීම් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ගීකරණය කරනු ලැබේ. ඊට අමතරව මූල්‍ය වත්කම් වලින් (උදාහරණ ලෙස මූල්‍ය ක්‍රියාකාරකම් වලින් පැන නගින ඉදිරිරැකුම් වගකීම් වන වත්කම්) මුදල් ප්‍රවාහ හෝ අනාගත මුදල් ප්‍රවාහ ලෙස මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස මුදල් ප්‍රවාහවල ඇතුලත් කර ඇත්නම් එම මූල්‍ය වත්කම්වල වෙනස්වීම් වලට 44අ ඡේදයේ අවශ්‍යතාවය හෙළිදරව් කිරීමද ව්‍යවහාර කරයි.

44ඈ 44අ ඡේදයේ අවශ්‍යතාවය හෙළිදරව් කිරීම සම්පූර්ණ කිරීමට, 44ආ ඡේදයේ හඳුනාගත් වෙනස්වීම් ඇතුලත්ව මූල්‍ය ක්‍රියාකාරකම් වලින් පැන නගින වගකීම් සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ආරම්භක සහ අවසාන ශේෂ අතර සැසඳීමක් සැපයීම එක මාර්ගයකි. අස්තිත්වය එවැනි සැසඳීමක් හෙළිදරව් කරන අවස්ථාවකදී, මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට සැසඳීම තුල ඇතුලත් අයිතම් අතර සම්බන්ධතාවය හඳුනාගැනිමට හැකියාව ලබාදෙන ප්‍රමාණවත් තොරතුරු ලබා දිය යුතුය.

44ඉ වෙනත් වත්කම් සහ වගකීම්වල වෙනස්වීම්වල හෙළිදරව් කිරීම් සමඟ සංයෝජනය තුල 44 අ ඡේදය මගින් අවශ්‍ය කරන හෙළිදරව් කිරීම අස්තිත්වය සපයයි නම් එම වෙනත් වත්කම් සහ වගකීම්වල වෙනස්වීම් තුලින් වෙනමම මූල්‍ය ක්‍රියාකාරකම් වලින් පැන නගින වගකීම්වල වෙනස්වීම් එය හෙළිදරව් කළයුතුය.

## බලපැවැත්වෙන දිනය

...

60 2016 සැප්තැම්බර් නිකුත් කළ හෙළිදරව් කිරීමේ මුල පිරීම (LKAS 7 ට සංශෝධන), 44අ - 44ඉ ඡේද අළුතින් එකතු කර ඇත. අස්තිත්වයක් 2017 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා එම සංශෝධන ව්‍යවහාර කළයුතුය. කලින් ව්‍යවහාර කිරීමට අවසර ඇත. අස්තිත්වයක් එම සංශෝධන ප්‍රථමවරට ව්‍යවහාර කරන විට පූර්ව කාලපරිච්ඡේද සඳහා සංසන්දනාත්මක තොරතුරු සැපයීමට අවශ්‍ය නොවේ.

## උපලබ්ධි නොවූ අලාභ සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගැනීම (LKAS 12 ආදායම් බදු වලට සංශෝධන)

29 ඡේදය සංශෝධනය කර ඇති අතර, 27අ, 29අ සහ 98උ ඡේද අළුතින් එකතු කර ඇත. 26 ඡේදයේ උදාහරණය ද අළුතින් එකතු කර ඇත. අළුත් පාඨ යටින් ඉරක් ගසා ඇත. 24, 26(ඇ), 27 සහ 28 ඡේද සංශෝධන කර නොමැති නමුත් යොමුවේ පහසුව සඳහා ඇතුලත් කර ඇත.

## අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්

24 **(අ) ව්‍යාපාර සංයෝජනයක් නොවන; සහ**

**(ආ) ගණුදෙනු සිදුවන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභය හෝ බදු ලාභය (අලාභය) නොවන බලපෑමකදී,**

ගණුදෙනුවක් තුලදී, මුල්වරට වත්කමක් හෝ වගකීමක් හඳුනාගැනීමේදී විලම්භිත බදු වත්කම හටගන්නේ නම් හැර, අඩුකළ හැකි සියළුම තාවකාලික වෙනස්කම් ප්‍රයෝජනයට ගතහැකි වන බදු ලාභ ලැබෙතැයි ගම්‍ය වනතාක් දුරට ගම්‍ය වන ප්‍රමාණයට සියළුම අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කමක් හඳුනාගත යුතුයි.

**කෙසේවුවද පරිපාලිතයන්, ශාඛාවන් සහ ආශ්‍රිතයන්හි ආයෝජන සහ බද්ධ එකඟවීම්වල හිමිකම් සම්බන්ධ වූ අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කමක් 44 ඡේදයට අනුව හඳුනාගත යුතුයි.**

...

26 විලම්බිත බදු වත්කම් පැන නගින අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් වලට උදාහරණ පහත දක්වා ඇත:

(අ) ..

(ඇ) බදු පරමාර්ථ සඳහා සමාන ගැලපුම් කිරීමකින් තොරව සමහර වත්කම් ඒවායේ සාධාරණ ධාරණය කිරීම හෝ ප්‍රත්‍යාගණනය කළ හැකිය. (20 ඡේදය බලන්න) වත්කමේ බදු පදනම එහි ධාරණ අගය ඉක්ම වුවහොත් අඩුකළ හැකි තාවකාලික වෙනසක් හටගනී.

<u>26 ඇ ඡේදයෙන් පැහැදිලි කරන උදාහරණය</u>

<u>වර්ෂ 2 අවසානයේදී, අඩුකළ හැකි තාවකාලික වෙනස්කමක් හඳුනාගැනීම:</u>

<u>A අස්තිත්වය සෑම වර්ෂයක් අවසානයේදී ගෙවිය යුතු පොලි අනුපාතිකය 2%ක් සමග අවුරුදු 5 දී කල්පිරීම මත ගෙවිය යුතු රු. 1,000 ක් නාමමාත්‍ර අගයකින් යුක්ත ණය උපකරණයක් රු. 1,000 කට වසර මුල්දී මිලදී ගනී. සඵල පොලී අනුපාතිකය 2%කි. ණය උපකරණය සාධාරණ අගයට මනිනු ලැබේ.</u>

<u>2 වැනි වර්ෂය අවසානයේදී වෙළෙඳපොළ පොළී අනුපාතිකය 5% දක්වා වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ණය උපකරණයේ සාධාරණ අගය රු. 918 කට අඩුවී තිබිණි. ණය උපකරණය දිගටම තබා ගන්නේනම් සියළුම ගිවිසුම්මය මුදල් ප්‍රවාහ A අස්තිත්වයට එකතු කළ හැකි බව හව්‍ය වේ.</u>

<u>ණය උපකරණය මත ඕනෑම ලාභ (අලාභ) ඒවා උපලබ්ධි වූ විට පමණක් බදු අයකළ හැකි (අඩුකළ හැකි) වේ. ණය උපකරණය විකිණීම හෝ කල්පිරීම මත පැන නගින ලාභය (අලාභය), එකතු කර ගත් මුදල සහ ණය උපකරණයේ මූලික පිරිවැය අතර වෙනස වශයෙන් බදු අරමුණ සඳහා ගණනය කරනු ලබයි.</u>

<u>ඒ අනුව ණය උපකරණයේ බදු පදනම වන්නේ එහි මුලින්ම වූ පිරිවැයයි.</u>

විකිණීමෙන් හෝ භාවිතයෙන් එනම් එය තබාගැනිමෙන් සහ ගිවිසුම්මය මුදල් ප්‍රවාහ හෝ දෙකෙහිම සංයෝජනයක් එකතු කිරිමෙන් ණය උපකරණයේ ධාරණ අගය නැවත ලබාගැනීම A අස්තිත්වය අපේක්ෂා කරන්නේ දැයි නොසලකා රු. 918, A අස්තිත්වයේ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ඇති ණය උපකරණයේ ධාරණ අගය සහ රු. 1,000ක් වන එහි බදු පදනම අතර වෙනස 2 වැනි වර්ෂය අවසානයේ (20 සහ 26ඈ ඡේද බලන්න) රු82 අඩුකළ හැකි තාවකාලීක වෙනස්කමක් හටගැනීමට තුඩු දෙයි.

මෙය වත්කමේ හෝ වගකීමේ ධාරණ අගය නැවත අයකර ගන්නා විට හෝ පියවනවිට (5 ඡේදය බලන්න) අනාගත කාලපරිච්ඡේද වල බදු ලාභය (බදු අලාභය) නිශ්චය කිරීමේදී අඩුකළ හැකිවන ප්‍රමාණය ප්‍රතිඵල දෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කමක හෝ වගකීමක ධාරණ අගය සහ බදු පදනම අතර වෙනස අඩුකළ හැකි තාවකාලීක වෙනස්කම් නිසාය. A අස්තිත්වය, විකිණීමේදී හෝ කල්පිරීමේදී බදු ලාභය (බදු අලාභය) නිශ්චය කිරීමේදී රු. 1,000 ක වත්කමක බදු පදනමට සමාන අඩු කිරීමක් ලබාගනී.

27 අඩුකළ හැකි තාවකාලීක වෙනස්කම් ප්‍රතිවර්ත්‍ය කිරීමෙන් අනාගත කාලපරිච්ඡේදවල බදු ලාභ නිශ්චය කිරීමේදී අඩු කිරීම් ප්‍රතිඵල දේ. කෙසේවුවද බදු ගෙවීම අඩුවීම් වශයෙන් ආර්ථික ප්‍රතිලාභ අස්තිත්වයකට ගලා එනුයේ අඩුකිරීම් හිලව්කර ගැනීමට ප්‍රමාණවත් බදුවන ලාභ උපයා ගන්නේ නම් පමණි. එම නිසා අස්තිත්වයක් විසින් විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් ප්‍රයෝජනයට ගතහැකි වන ලාභ ලබනු ඇතැයි භව්‍ය වන්නේ නම් පමණි.

27අ අස්තිත්වයක ප්‍රයෝජනයට ගතහැකි අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් ලාභයට එරෙහිව හිලව් කරගැනීම සඳහා ඉදිරියේදී බදුවන ලාභ පැවතිය හැකිදැයි නැද්ද යන්න තක්සේරු කිරිමදී එම අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් හිලව් කර ගතහැකි බදුවන ලාභය ලැබෙන මූලාශ්‍රය පිළිබදව බදු නීති සීමා කිරිම් පනවන්නේදැයි සලකා බලයි. බදු නීති මගින් එවැනි සීමා කිරීම් පනවනු නොලබන්නේ නම් අස්තිත්වයක් අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්, වෙනත් අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සියල්ලම සමඟ සංයෝජනයෙන් තක්සේරු කළයුතුය. කෙසේවුවත් බදු නීති මගින් යම් අලාභයක විශේෂිත වර්ගයක ආදායමෙන් එරෙහිව අඩු කරගැනීම පිළිබදව සීමා කිරිම් පනවන්නේ නම් අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් වර්ගයේම යෝග්‍ය අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සමඟ පමණක් සංයෝජනයෙන් තක්සේරු කළයුතුය.

28 (අ) අඩුකළ හැකි තාවකාලික වෙනස ප්‍රතිවර්ත්‍ය කිරීමට අපේක්ෂා කරන කාලපරිච්ඡේදය තුළදීම ප්‍රතිවර්ත්‍ය කිරීමට අපේක්ෂා කරන; හෝ

(ආ) විලම්භිත බදු වත්කමකින් පැන නගින බදු අලාභයක් ඉදිරියට හෝ අතීතයට ගෙන යා හැකි කාලපරිච්ඡේද තුල ප්‍රතිවරත්‍ය කිරීමට අපේක්ෂා කරන,

එකම බදුකරණ අධිකාරියට හා එකම බදුවන අස්තිත්වයට සම්බන්ධ ප්‍රමාණවත් බදුවන තාවකාලික වෙනස්කම් ඇති විට අඩුකළ හැකි තාවකාලික වෙනස කපාහැරිම සඳහා ප්‍රයෝජනයට ගත හැකි බදුවන ලාභ ලැබෙන බව භව්‍ය වේ.

එවැනි අවස්ථාවල දී අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් පැන නගින කාලපරිච්ඡේදයේ දී විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලැබේ.

29 එකම බදුකරණ අධිකාරියට සහ එකම බදුවන අස්තිත්වයට සම්බන්ධිත ප්‍රමාණවත් නොවූ බදුවන තාවකාලික වෙනස්කම් ඇතිවිට විලම්භිත බදු වත්කම හඳුනාගනු ලබන්නේ;

අ. අස්තිත්වයට අඩුකළ හැකි තාවකාලීක වෙනස ප්‍රතිවර්ත්‍ය කරන කාලපරිච්ඡේදය තුලදීම එකම බදු අධිකාරියට සහ එකම බදුවන අස්තිත්වයට සම්බන්ධ ප්‍රමාණවත් බදුවන ලාභ ලැබීමේ භව්‍යතාවයක් තිබේ. (හෝ විලම්භිත බදු වත්කමින් පැන නගින බදු අලාභ ඉදිරියට හෝ අතීතයට ගෙන යා හැකි කාලපරිච්ඡේදවලදී) අනාගත කාලපරිච්ඡේදවලදී ප්‍රමාණවත් බදු ලාභ තිබේදැයි ඇගයීමේදී, අස්තිත්වයක්

i. අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්වල ප්‍රතිඵලය වශයෙන් ඇති වන බදු අඩු කිරිම් ඉවත් කරන ලද අනාගත බදු ලාභය සමඟ අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්වල සසඳයි. මෙම සැසඳීම මඟින් එම අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්වල ප්‍රතිඵලය වශයෙන් ඇති වන මුදල් ප්‍රමාණයන්

අඩුකර ගැනීමට අස්තිත්වයට කොතරම් දුරට අනාගත බදු වන ලාභ ප්‍රමාණයන් තිබේද යන්න පෙන්නුම් කරයි; සහ

ii. අනාගත කාලපරිච්ඡේදවලදී ජනිතවේයැයි අපේක්ෂිත අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්වල පැන නගින විලම්භිත බදු වත්කමක් ප්‍රයෝජනයට ගැනීම සඳහා අනාගත බදුවන ලාභය අවශ්‍ය වන බැවින් අනාගත කාලපරිච්ඡේද ජනිත වේ යැයි අපේක්ෂිත අඩුකළ හැකි තාවකාලීන වෙනස්කම් වලින් හටගන්නා බදුවන ප්‍රමාණයට නොසලකා හරී.

ආ. අස්තිත්වයට උචිත කාලපරිච්ඡේදවලදී බදුවන ලාභ ජනිත කිරීමට බදු සැලසුම් අවස්ථාවන් තිබෙන ප්‍රමාණය දක්වා.

29අ එසේ සිදුවීම පිළිබඳව භව්‍යතාවයක් ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි තිබේ නම් ඇස්තමේන්තුගත භව්‍ය අනාගත බදු ලාභයේ අස්තිත්වයේ වත්කම්වල ධාරණ අගයට වඩා වැඩියෙන් අයකර ගත හැකි මුදල් ප්‍රමාණයන් ඇතුලත් කළ හැකිය. උදාහරණ ලෙස වත්කමක් සාධාරණ අගයට මනිනු විට, අස්තිත්වය එහි ධාරණ අගයට වැඩියෙන් මුදල් අයකර ගැනීම භව්‍ය වන බවට නිර්ණය කළහැකි ප්‍රමාණවත් සාක්ෂි සලකා බලයි. අස්තිත්වයක් ස්ථිර අනුපාතික ණය උපකරණයක් තබාගැනීමට සහ ගිවිසුම්මය මුදල් ප්‍රවාහ එකතු කිරීම අපේක්ෂා කිරීම වැනි සිද්ධියක් උදාහරණයක් වේ.

…

## බලපැවැත්වෙන දිනය

…

98උ 2016 සැප්තැම්බර් නිකුත්කළ උපලබ්ධි නොවූ අලාභ සඳහා විලම්භීත බදු වත්කම් හඳුනාගැනීම (LKAS 12ට සංශෝධන) 29 ඡේදය සංශෝධනය කළ අතර 27අ, 29අ සහ 26 ඡේදයට අදාල උදාහරණ අලුතින් එකතු කර ඇත. අස්තිත්වයක් 2017 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා මෙම සංශෝධන ව්‍යවහාර කළයුතුය. කලින් ව්‍යවහාර කිරීමට අවසර ඇත. පෙර කාලපරිච්ඡේදයන්හි අස්තිත්වයක් මෙම සංශෝධන ව්‍යවහාර කරයි නම් එම කරුණ හෙළිදරව් කළයුතුය. අස්තිත්වයක් LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි අනුව එම සංශෝධන අතිතානුයෝගිව ව්‍යවහාර කළයුතුය. කෙසේ නමුත් සංශෝධනය මුලින්ම ව්‍යවහාර කිරීම මත කලින්ම සංසදනාත්මක කාලපරිච්ඡේදයේ ආරම්භක ස්කන්ධය තුල වෙනස, ආරම්භක රඳවාගත් ඉපයීම් සහ වෙනත් ස්කන්ධ සංරචකවල අතර වෙනස අතර බෙදා හැරීම නොකර ආරම්භක රඳවාගත් ඉපයීම්වල (හෝ යෝග්‍ය ලෙස වෙනත් ස්කන්ධ සංරචකයක) හඳුනාගත හැකිය. මෙම සහනය අස්තිත්වය ව්‍යවහාර කරයි නම් එම කරුණු හෙළිදරවු කළයුතුය.

01 - 219

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.